# කලාකෘති මඟින් හෙළිවන අනුරාධපුර යුගයේ භාවිත ඇඳුම්පැළඳුම් හා ආභරණ

ඊ.එම්.එන්. එදිරිනායක

තෙ වැනි වසර, පුරාවිද්‍යා ශාස්ත්‍රවේදී (විශේෂ)

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය

*nilusha3615@gmail.com*

මිනිසාගේ සිතෙහි මැවෙන, දැනෙන ඇසට පෙනෙන දෙය අන් අයට දැනවීමට භාවිත කරන ලද මාධ්‍යයක් ලෙස කලාව හඳුනාගත හැකි ය. එවන් කලාවකට උරුමකම් කියන අතීතයක් ලංකාව සතු ය. එසේ නම් අතිතයේ සිට වර්තමානයට යම් යම් දේ දැනවීමට අතීතයේ නිර්මාණය වූ කලාත්මක අංගයන්ට හැකියාව ඇත. පොදු පිළිගැනීම නම් මිනිසාගේ පරිණාමයත් සමඟ ශාක පත්‍ර ඇඳුම් ලෙස භාවිතා කරන්නට වූ අතර ඉන්පසුව ක්‍රමයෙන් සංවර්ධනය වූ මානවයා මුහුදු බෙලිකටු වැනි දේ එකට අමුනා පැළඳීමෙන් ආභරණ භාවිතයට පෙළඹී ඇත. මෙසේ ක්‍රමයෙන් වර්ධනය වන මිනිසා කපු වැනි ස්වභාවික ද්‍රව්‍ය භාවිතයෙන් ඇඳුම් භාවිතයට පෙළඹී ඇති බව සාහිත්‍ය මූලාශ්‍ර මඟින් අවබෝධ කරගත හැකි ය.

අනුරාධපුරය ලංකාවේ ප්‍රථම රාජධානිය බව මූලාශ්‍රගත කරුණු අනුව හඳුනාගත හැකි ය. එනම්, මෙරටට පැමිණි ආර්යයන් ලංකාවේ ජනපද පිහිටුවා ගැනීමෙහි ප්‍රතිඵලයක් ලෙස, "අනුර" නම් පුද්ගලයා විසින් මෙහි අනුරාධ ග්‍රාමය පිහිටුවාගත් බවත්, මෙය නගරයක් බවට පත්කරනු ලබන්නේ පණ්ඩුකාභය රජු විසින් බව මහාවංශය ඇතුළු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මඟින් හඳුනාගත හැකි ය.

මෙම රජු විසින් ක්‍රි. පූ 3 සියවසේ දී ආරම්භ කරන ලද මෙම රාජධානිය විවිධ පෙළපත් වල විවිධ පාලකයන් යටතේ ක්‍රි. ව. 1017 වනතෙක්, එනම්, වසර 1400ක් පුරාවට පැවත ඇත. මෙම දිගු ඉතිහාසය තුළ ජීවත් වූ ජනයා නිර්මාණය කරන ලද කලාත්මක අංග තුළින් ඔවුන් භාවිත කරන ලද ඇඳුම්පැළඳුම් හඳුනාගනීම, එමඟින් පුද්ගලයන්ගේ සමාජ තත්ත්වය හඳුනාගැනීම, සමාජ තරාතිරම් හඳුනාගැනීම මෙහි අරමුණ වේ. ඒ අනුව මේ සඳහා අනුරාධපුර යුගයේ නිර්මාණය වූ ප්‍රතිමා, මූර්ති යොදාගන්නා ලදී. මීට අමතර ව අනුරාධපුර යුගයේ ජනයාගේ ඇඳුම් භාවිතා කළ අවස්ථා පිළිබඳ තොරතුරු සාහිත්‍ය මූලාශ්‍ර මඟින් ද හඳුනාගත හැකි ය. ඒ අනුව මහාවංශයේ දැක්වෙන ආකාරයට විජය ඇතුළු පිරිස ලංකාවට පැමිණෙන විට කුවේණිය නම් කාන්තාව කපු කටිමින් සිටි බව සඳහන් වේ. එමෙන් ම මහාවංශය තව දුරටත් දක්වන පරිදි විජය කුමරු ලක්

රජු මරා ඔවුන්ගේ වස්ත්‍ර පරිහරණය කොට රජ වූ බව දක්වයි. සීහලවත්ථුපකරණය සාහිත්‍ය කෘතියට අනුව සද්ධාතිස්ස රජුගේ කාලයේ තිස්ස නම් සන්නාලියෙක් විසූ බව සඳහන් කරයි. සද්ධර්මරත්නාවලියෙහි රෙදි විවීම සඳහා භාවිතා කරන ලද නූල් දමන ඉඳිකටු පිළිබඳ ව සඳහන් වේ. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වශයෙන් ගැනෙන මහරත්මලේ සෙල්ලිපියේ ද ඇඳුම් නිෂ්පාදනය කළ පෙහෙකරුවන් ගැන සඳහන් වේ. මෙමඟින් පැහැදිලි වන්නේ මෙම යුගයේ ඇඳුම්පැලඳුම් භාවිතය හා නිෂ්පාදනය බහුල ව පැවති බව ය. ඒ අනුව මෙම ඇඳුම් හා ආභරණ පිළිබඳ සාධක ලබාදෙන ප්‍රතිමා හා කැටයම් මඟින් පහත පරිදි දැක්විය හැකි ය. එනම්, මෙම කැටයම් හා ප්‍රතිමා මඟින් අනුරාධපුර යුගයේ ජනයා භාවිත කල ඇඳුම්පැළඳුම් පිළිබඳ අධ්‍යයනය කිරිමේදී ද යොදාගත හැක. මෙමඟින් ප්‍රධාන වශයෙන් රාජ්‍ය පාලකයන්, ප්‍රභූ ජනයා හා සාමාන්‍ය ජනයා යන අය භාවිතා කරන ලද ඇඳුම්පැළඳුම් හා ආභාරණ මඟින් ඔවුන්ගේ මෙම සමාජ මට්ටම හඳුනාගැනීම සිදු කර ඇත. මෙහි දී සැලකිලිමත් විය යුතු කරුණු නම්, මෙම කැටයම් හා සිතුවම් නිර්මාණය වනුයේ විවිධ සම්ප්‍රදායන් යටතේ ය. එම නිසා විදේශ ආභාසය මත ඇඳුම්පැළඳුම් ආදිය වෙනස් විය හැකි ය. මේ පිළිබඳ ව අවධානය යොමු කරමින් සංසන්දනාත්මක ලෙස අධ්‍යයනය කල යුතු ය.

පළමුව රාජකීය පිරිස් විසින් භාවිත කරන ලද ඇඳුම් හා ආභරණ පිළිබඳ තොරතුරු පහත පරිදි දැක්විය හැක. මහාවංශය, ධාතුවංශය, සහස්සවත්ථුපකරණය ආදී සාහිත්‍ය මූලාශ්‍රයවල දැක්වෙන පරිදි පොරෝනා සළු භාවිතා කල බව සඳහන් වේ. මේ බව සනාථ කරගත හැකි ප්‍රතිමා හා කැටයම් ඉතාමත් විරල වේ. දැනට මිහින්තලයෙන් සොයාගෙන ඇති රජරුවක් යැයි අනුමාන කරන ප්‍රතිමාව හඳුනාගැනීමට අපහසු වූවත්, මෙහි යටිකය දෝතියකින් සමන්විත බව හඳුනාගත හැකි ය. එමෙන් ම අනුරාධපුරයේ රුවන්වැලි සෑය අසල ඇති රජරුවක් යැයි අනුමාන කරන රුවෙහි යටිකය දෝතියකට සමාන ලිහිල් ව ගලා වැටෙන ඇඳුමකින් සමන්විත ය. අලංකාර ශිර්ෂාභරණයක් සහ මුදුනේ බඳින ලද කොණ්ඩය හා දෙකන් සිදුරු සහිත වුව ද ආභරණ දැකගත නොහැකි ය. එමෙන් ම රජෙකුගේ යැයි අනුමාන කරන ගලින් කළ හිසක කොටසක් ථූපාරාමයෙන් සොයාගෙන ඇත. මෙහි ද දෙකන් වල ආභරණ දක්නට නොලැබෙන අතර හිසෙහි ඔටුන්නක් දක්නට ලැබේ.

රජරුවන්ගේ ඇඳුම් පිළිබඳ සාධක ලබාදෙන තවත් මූර්ති ලෙස අවලෝකිතේශ්වර බෝසත් රුව ගත හැක. ඒ අනුව ක්‍රි.ව.9 වන සියවසට අයත් අවලෝකිතේශ්වර බෝසත් රුව රාජකීය ඇඳුමින් සරසා ඇත. එහි ද යටි කය දෝතියකට සමාන කඩා හැලෙන ඇඳුමකින් සැරසී ඇත. වම් උරහිස හරහා වැටුන රෙදි කඩකි. ඉඟටියේ හා දෑතේ වළලු දක්නට ලැබේ. පැහැදිලිව ම මෙය බෝසත් රුවක් වුවත් එහි රාජකීය ඇඳුම් දක්නට ලැබෙන බව හඳුනාගත හැකි බව උපකල්පනය කළ හැක.

ඉසුරුමුණියේ රජ රුව සහිත රජ පවුල නිරූපණය වන කැටයමෙහි වෙනසක්

දැකිය හැකි ය. එනම්, මෙහි යටි කය ආවරණය කොට ඇති සළුව ඉතාමත් කෙටි වී ඇත. වම් උරහිසේ සිට පහළට දිවෙන ආභරණයක් වැනි දෙයකි. හිසෙහි ඔටුන්නක් ද දැකගත හැදි ය. මෙම රාජ රූපයේ ඇඳුම්, අනෙක් මූර්ති හා සංසන්දනය කිරීමේ දී මෙසේ රජ රුවේ ඇඳුම (යටිකය දෝතිය කෙටි වීම) වෙනස් වූයේ විදේශ ආභාසය නිසා යැයි සිතිය හැකි ය. මෙම කැටයමේ ඇඳුම් හා ආභරණවලට සමාන තවත් කැටයම් රූප දෙකක් හඳුනාගත හැකි ය. එනම්, මිනිසා හා අශ්ව හිස දක්වන කැටයම හා ඉසුරුමුණි පෙම්යුවල දක්වන රුවේ ද මෙම ලක්ෂණය දැකගත හැකි ය. මෙකී සමස්ථ කරුණුවලින් පැහැදිලි වනුයේ රජු යටිකය දෝතියකට සමාන ඇඳුමින්, හා ආභරණවලින් සමන්විත බව හඳුනාගත හැකි ය. නමුත් මෙහි වෙනසක් දැකිය හැකි ය. එනම්, රජ පවුල කැටයමෙහි හා ඉසුරුමුණි පෙම්යුවල දක්වන කැටයම මිනිසා හා අශ්ව හිස යන දෙකෙහි ම පුරුෂ රුවෙහි ඇඳුම්, ආභරණ සමාන වේ. මෙහි දී මතුවන ගැටලුවක් වනුයේ ඇතමුන් දක්වන ආකාරයට ඉසුරුමුණි පෙම්යුවල කැටයමේ පුරුෂ රුව සෙබලෙක් ලෙස හඳුනාගත හොත් මිනිසා හා අශ්ව හිස, රජ රුව ද සෙබලෙක් ලෙස ගැනීමට සිදුවේ. මෙහි දී මතක තබාගත යුතු වනුයේ මෙම කැටයම් 03 නිර්මාණය වනුයේ විදේශ ආභාසය (ගුප්ත හා පල්ලව) සහිත ව බව ය. මෙම කැටයම්වල ඇඳුම් ආභරණ බහුල ව දැකිය හැකි වීමයි. එනම්, රාජකීය සෙබලුන් ආභරණ භාවිත කල බව සිතිය නොහැකි වීමයි. මෙයට හේතුව විදේශ ආභාසය බලපෑ බව ද ඍජුව ම ප්‍රකාශ කළහැකි නමුත් සම්පූර්ණ වශයෙන් එම ආභාසය මෙම කැටයම් වලට බලනොපෑ බව එම ආභාසය සහිත ඉන්දියාවේ හා ලංකාවේ කැටයම් සංසන්දනය කිරීමේ දී පැහැදිලි වේ. ඒ අනුව පැහැදිලි වන්නේ ඇඳුම්වල සුළු වෙනස්කම් ඇතත් ඒවා බොහෝ දුරට රජ ඇඳුමට සමාන බවකි. මේ අනුව මුල් කාලයේ රජවරු භාවිතා කරන ලද කඩා හැලෙන දෝතිය කෙටි එකක් වන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. එමෙන් ම මෙම යුගයේ පුරුෂයන් යටිකය පමණක් සඳහා සළු භාවිතා කළ බව ක්‍රි.ව. 5 වන සියවසට අයත් තිස්සමහාරාමයෙන් හමු වූ දඬයක්කරුවෙක් නිරූපිත සිතියමකින් හඳුනාගත හැකි ය. මෙම කැටයම් භාවිතයෙන් අනුරාධපුර යුගයේ ප්‍රභූ කාන්තාවගේ ඇඳුම් හා ආභරණ ගැන සැලකීමේ දී මෙම කැටයම් යොදාගත හැකි ය. ඒ අනුව කාන්තා ඇඳුම් ආකාර කිහිපයක් හඳුනාගත හැකි ය.

1. උඩුකය නිරුවත් සහ යටිකය දෝතියක් හෝ රෙදිකඩක් හා ආභරණ බහුල නොවන කාන්තා රූප.
2. උඩුකය දුහුල් සළුවකින් සැරසී සිටින අතර යටිකය දෝතියකින් හා ආභරණ බහුල කාන්තා රූප.

බොහෝවිට උඩුකය දුහුල් සළුවකින් යටිකය දෝතියකට සමාන ඇඳුමකින් හා ආභරණවලින් සමන්විත කාන්තාවන් ප්‍රභූ හෝ රජ පවුල කාන්තාවන් ලෙස හඳුනාගත හැකි ය. මෙයට උදාහරණ ලෙෂ, ඉසුරුමුණියේ රජ පවුල නිරූපිත කැටයම්හි කාන්තාවන් දෙදෙනෙක් දැකගත හැකි අතර මෙහි රජු ආසන්නයේ සිටින කාන්තාව රජුගේ බිසව ලෙස උපකල්පනය කලහැකි ය. ඇගේ ඉහත දැක් වූ උඩුකය දුහුල් සළුවකින් යටිකය

දෝතියකට සමාන ඇඳුමකින් හා ආභරණවලින් සමන්විත ය. මෙහි එම කාන්තාවට පිටුපසින් සිටින අනෙක් කාන්තාවන්ගේ ඇඳුම් ආභරණ එලෙස පැහැදිලි ව හඳුනාගත නොහැකි ය. නමුත් මෙහි දැක්වෙන රජරුව සහිත කාන්තා රූපය හා ඉසුරුමුණි පෙම්යුවල දැක්වෙන කැටයමේ ද මෙම ලක්ෂණ සහිත ස්ත්‍රී රූපයක් හඳුනාගත හැකි ය. මෙම ස්ත්‍රී රූප දෙකෙහි ම කර්ණාභරණ, ග්‍රිවාභරණ, බාහු වළලු දැකගත හැකි ය. මෙයින් පැහැදිලි වනුයේ මෙම ලක්ෂණ සහිත කාන්තාවන් ප්‍රභූ කාන්තාවන් බව ය. නමුත් ඉසුරුමුණි පෙම් යුවල දැක්වෙන ස්ත්‍රී රූපය උඩුකය නග්නව ඇති බව ඇතැමෙකු පෙන්වාදෙයි. නමුත් මෙහි ගෙල වටා යන පබළු වැනි දෙයකින් ඇගේ උඩුකය වස්ත්‍රය නිරූපණය වන බව සිතිය හැකි ය. එම නිස ඇය ප්‍රභූ කාන්තාවක් ලෙස ගතහොත් ඇය සාලිය කුමරුන් සමඟ සිටින සැඩොල් ස්ත්‍රියක් බව නිශේධණය වේ. නමුත් මෙම කැටයම් ගුප්ත කලා ආභාසය සහිත නිසා මෙසේ ප්‍රභූ නොවන කාන්තාවන් සඳහා ද මෙය යොදන්නට ඇති බව සිතිය හැකි ය. එමෙන් ම අනුරාධපුර යුගයේ හමුවන අනෙක් ඇඳුම් වර්ගය නම්, උඩුකය නිරුවත් සහ යටිකය දෝතියකින් හා ආභරණ බහුල නොවන කාන්තා රූපයි. ක්‍රි.ව. 5 වැනි සිසවසට අයත් සීගිරිය රාමකැලේ මහාමෙරු ආකෘතියේ එන මිනිස් ලොව නිරූපනය කරන කැටයමෙන් උඩුකය නිරුවත් යටිකය දෝතියකට සමාන ඇඳුමකින් සමන්විත කාන්තා රූප මඟින් සාමාන්‍ය ජනයා නිරූපනය වන බව හඳුනාගත හැකි ය. නමුත් මතුවන ගැටලුවක් නම්, උඩුකය නිරුවත් යටිකය දෝතියකට සමාන ඇඳුමකින් සමන්විත කාන්තා රූප මඟින් ප්‍රභූ කාන්තාවන් බව ඇතැමෙකු දක්වන අතර එයට උදාහරණ අතර, උඩුකය නිරුවත් කවන්ධ ස්ත්‍රී රූප මඟින් ද ප්‍රභූ කාන්තාවන් නිරූපනය වන බව දක්වයි. නමුත් ඉහත දැක් වූ මහාමේරු කැටයම මඟින් ජේතවනාරාමයෙන් හමු වූ මිණිමෙවුල සහිත කැටයම අභයගිරි මුරගලෙහි ඇති ස්ත්‍රී හා පුරුෂ රූප කැටයම් මඟින් ද හඳුනාගත හැක්කේ උඩුකය නිරුවත් යටිකය දෝතියකට සමාන ඇඳුමකින් සමන්විත කාන්තා රූපයි. ඉහත දැක් වූ මතය හා සැසඳීමෙන් එනම්, උඩුකය නිරුවත් ස්ත්‍රී කැටයම් හා ප්‍රතිමා ප්‍රභූ කාන්තාවන් නිරූපනය වන්නේ නම් සාමාන්‍ය කාන්තාව හා ප්‍රභූ කාන්තාව හඳුනාගන්නේ කෙසේදැයි යන ගැටලුව ඇති වේ. මෙහි දී භාවිතයට ගත හැක්කේ ඔවුන් භාවිතා කල ආභරණ මඟිනි. එමෙන් ම ප්‍රභූ කාන්තාවන්ගේ උඩුකය දුහුල් සළුවකින් ආවරණය වන්නට ඇති බව උපකල්පනය කල හැකි ය. ඒ අනුව රජ, ප්‍රභූ හා සාමාන්‍ය ජනයා පැහැදිලි ව හඳුනාගත හැකි ය. ඒ අනුව මෙයින් පැහැදිලි වනුයේ මෙම යුගයේ රජු ඇතුළු ප්‍රභූ ජනයාගෙන් සමන්විත සමාජය හා සාමාන්‍ය ජනයාගෙන් සමන්විත පිරිස් ස්ත්‍රී, පුරුෂ භාවිතා කළ ඇඳුම් හා ආභරණ මඟින් හඳුනාගත හැකි ය.